# පුන්සඳ හිනැහෙන්නේ

©LankaSongBook - ලංකා ගී පොත

A F#m Bb A
පුන්සඳ හිනැහෙන්නේ - වන මල් පිබිදෙන්නේ
A F#m E Bb A
ලස්සන ඔබේ මුහුණේ - දැක්කම නොවැ මැණිකේ
A E A E Bb E A
කොයිබද ඔබ යන්නේ - මේ උදයේම අපේ ලන්දේ
D Bb A E A
මගෙ පැල්පත පැත්තේ - ඔබ සම්පත ගෙන එන්නේ

A F#m A Bb E
වසන්ත සමයදී ඔබ ළඟ ඉඳගෙන මිහිරට කවි කියමි
D Bb F#m Bb E A
සමන් කැකුළු මල් පොකුරක් අරගෙන ඔබේ හිසේ ගසමි
F#m Bb E A F#m E A
ඔබ නිදියන තුරු පැළ තුළ ඉඳගෙන නැළවිලි ගී ගයමි
Bb A D A E A
උදය සවස මම ඔබෙ පා යුග - හිමියනි සැමදා වඳිමි

A F#m A Bb E
නිල් දිය බැස යන ගංගාවේ මම ඔබ හා ඔරු පදිමි
D Bb F#m Bb E A
සඳ ඇති කාලෙට ඔබෙ සුදු අත ගෙන ගංතෙර වෙත දුවමි
F#m Bb E A F#m E A
පලතුරු යුෂ ගෙන මී පැණි දවටා රස කර එය පොවමි
Bb A D A E A
කුමුරට යන්නට පෙර බත ඇඹුලද සාදා ඔබට දෙමි

A F#m Bb A
පුන්සඳ හිනැහෙන්නේ - වනමල් පිබිදෙන්නේ
F#m Bb E Bb A
නිල් දිය බැස යන්නේ - ආසිරි පුද දෙන්නේ
A F#m A E Bb E A
මොණරුන් රඟ දෙන්නේ - පොඩි කුරුලන් නද දෙන්නේ
D Bb A E A
අප දෙස බලමින්නේ - උන් සැම දෙන සැනසෙන්නේ

Chandana Hewage.